UNITED NATIONS NATIONS UNIES

**THE SECRETARY-GENERAL**

--

**මානව හිමිකම් දින පණිවිඩය**

**<u>නිව් යෝර්ක්, දෙසැම්බර් 10, 2022</u>**

ලෝකය මානව හිමිකම් සම්බන්ධයෙන් පෙර නොවූ විරූ අන්තර් සම්බන්ධිත අභියෝගවලට මුහුණ පා ඇත.

මිලියන සිය ගනනක් ජනයාගේ ආර්ථික හා සමාජ අයිතීන්ට නින්දා කරමින් කුසගින්න සහ දරිද්‍රතාවය ඉහළ යමින් පවතියි -

සිවිල් අවකාශය හැකිලෙයි.

ලෝකයේ සෑම කලාපයකම පාහේ මාධ්‍ය නිදහස සහ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව භයානක ලෙස පිරිහෙමින් පවතියි.

විශේෂයෙන්ම යොවුන් පරපුර අතර ආයතන කෙරෙහි විශ්වාසය සිඳෙමින් පවතී.

COVID 19 වසංගතය කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසන මට්ටම් ඉහළ යාමට හේතු වී තිබේ.

ජාතිවාදය, නොඉවසීම සහ වෙනස් කොට සැලකීම බහුලය.

දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය අහිමි වීම සහ දූෂණය යන ත්‍රිත්ව මිහිකත් අර්බුදයෙන් නව මානව හිමිකම් අභියෝග මතුවෙමින් තිබේ.

තවද සමහර නව තාක්ෂණයන් මගින් මානව හිමිකම්වලට එල්ල වී ඇති තර්ජනය අප ග්‍රහණය කර ගැනීම ආරම්භ වී තිබේ.

මෙම දුෂ්කර කාලය සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික සහ සමාජීය සියලු මානව හිමිකම් සඳහා අපගේ කැපවීම නැවත ඇරඹීම ඉල්ලා සිටියි.

2020 දී මා විසින් දියත් කරන ලද ක්‍රියා කිරීමට ඇමතීම (Call to action) මානව හිමිකම් අප මුහුණ දෙන අභියෝගවලට විසඳුම් මධ්‍යයේ ස්ථානගත කරයි.

මෙම දැක්ම මානව හිමිකම් තුළ නැංගුරම් ලා ඇති අලුත් සමාජ ගිවිසුමක් ඉල්ලා සිටින අපගේ පොදු න්‍යාය පත්‍රය (Our Common Agenda) පිළිබඳ මගේ වාර්තාවෙන් පිළිබිඹු වේ.

ලබන වසරේ මානව හිමිකම් පිළිබඳ ඓතිහාසික විශ්ව ප්‍රකාශනයේ 75 වැනි සංවත්සරය ක්‍රියා කිරීමට අවස්ථාවක් විය යුතුය.

මම සාමාජික රටවලින්, සිවිල් සමාජයෙන්, පෞද්ගලික අංශයෙන් සහ අනෙකුත් පුද්ගලයන්ගෙන් ඉල්ලා සිටින්නේ වර්තමාන හානිකර ප්‍රවණතා නැවත හැරවීමට දරන ප්‍රයත්නයේ හදවතෙහි මානව හිමිකම් රඳවන ලෙසයි.

මානව හිමිකම් යනු මානව අභිමානය සඳහා පදනම වන අතර සාමකාමී, සියල්ලන් ඇතුළත්, සාධාරණ, සමාන සහ සමෘද්ධිමත් සමාජවල මුල් ගල වේ.

ඒවා එක්සත් භාවයේ බලවේගයක් සහ පෙළගැස්මකි.

ඒවා අප බෙදා හදා ගන්නා මූලිකම දෙය - අපගේ පොදු මනුෂ්‍යත්වය පිළිබිඹු කරයි.

මෙම මානව හිමිකම් දිනයේ දී, අපි සියලු දෙනා මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින බැවින්, සියලු අයිතිවාසිකම්වල විශ්වීයත්වය සහ නොබෙදිය හැකි බව නැවත තහවුරු කරමු.

***